| ඡේද අංකය | දැනට පවතින පෙළ | ඡේද අංකය | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|---|
| 6.1.1<br>(පත්කිරීම් හා උසස් කිරීම් ක්‍රමය) | III පන්තිය බඳවා ගැනීමේ පන්තිය වන අතර සීමිත හා විවෘත යන දෙඅංශයෙන් ඉල්ලුම්පත් කැඳවා පැවැත්වෙන විභාගවලින් ලබන කුසලතාවය මත පහත සඳහන් ආකාරයට තෝරා පත් කෙරේ.<br><br>පුරප්පාඩු 70% විවෘත තරඟ විභාගයක ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන්ද 30% ක් සීමිත තරඟ විභාග ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන්ද පත් කරනු ලැබේ.<br><br>සීමිත තරඟ විභාගය යටතේ සුදුසුකම් ලබන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථා වලදී එම ප්‍රමාණයද විවෘත තරඟ විභාගය යටතේ සුදුසුකම් ලබන්නන්ගෙන් ලකුණු අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021-07-14 දින<br>එම්.ජී.ඒ.තිලකරත්න<br>ආණ්ඩුකාර ලේකම්<br>මධ්‍යම පළාත | 6.1.1<br>(පත්කිරීම් හා උසස් කිරීම් ක්‍රමය)<br><br><br><br>6.1.1.1 | III පන්තිය බඳවා ගැනීමේ පන්තිය වන අතර සීමිත හා විවෘත යන දෙඅංශයෙන් ඉල්ලුම්පත් කැඳවා පැවැත්වෙන විභාගවලින් ලබන කුසලතාවය මත පහත සඳහන් ආකාරයට තෝරා පත් කෙරේ.<br><br>පුරප්පාඩු 70% විවෘත තරඟ විභාගයක ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන්ද 30% ක් සීමිත තරඟ විභාග ඉල්ලුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබන්නන්ගෙන්ද පත් කරනු ලැබේ.<br><br>සීමිත තරඟ විභාගය යටතේ සුදුසුකම් ලබන්නන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථා වලදී එම ප්‍රමාණයද විවෘත තරඟ විභාගය යටතේ සුදුසුකම් ලබන්නන්ගෙන් ලකුණු අනුපිළිවෙල අනුව පුරවනු ලැබේ.<br><br>එහිදී විවෘත තරඟ විභාගය යටතේ සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනම මත කෙරෙනු ඇත. මධ්‍යම පළාතට අයත් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජනගහණයට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණනක් වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යව සඳහා තරඟ කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.<br><br>මෙම පළාතේ යම් දිස්ත්‍රික්කයකට ඉහත පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා ඉල්ලුම් කරන ලද සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවලදී, එම පුරප්පාඩු සංඛ්‍යාව මධ්‍යම පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක දෙක සඳහා එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහණ අනුපාතයට අනුව නැවත බෙදා හරිනු ඇත.<br><br>මධ්‍යම පළාත තුළ පිරවීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව ස්වල්පයක් නම් එම හේතුව මත දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම අදාල කරගත නොහැකි වන විට පමණක් කුසලතා අනුපිළිවෙලින් සුදුස්සන් තෝරනු ලැබේ.<br><br>විවෘත තරඟ විභාගය සමත්වන අයදුම්කරුවන් සංඛ්‍යාව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජනගහණ අනුපාත පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ. | 1. බඳවා ගැනීමේදී හා බඳවා ගත් නවක නිලධාරීන් ස්ථානගත කිරීමේදී පවතින ගැටලු හේතුවෙන් දිස්ත්‍රික් ජන අනුපාතිකය අනුව බඳවා ගැනීමට හැකි වන පරිදි බඳවා ගැනීම් සිදු කිරිමට ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබා දුන් උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා 6.1.1 වගන්තියට පසු 6.1.1.1 යනුවෙන් වගන්තිය ඇතුළත් කිරීම.<br><br>2. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 හා 28/95 අනුව රාජ්‍ය සේවයේ තනතුරු සඳහා විවෘත තරඟ විභාග මගින් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේදී ජනගහණ අනුපාතය සළකා බැලිය යුතු වීම. |